## සති පාසල - සබරගමුව පළාත

## නිවිතිගල අධ්‍යාපන කලාපය

## භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය - 2021 අගෝස්තු - හතරවන සතිය



**පැවරුම 8** **ශ්‍රී ලංකාවේ භූ දර්ශනය**

ඕනෑම ප්‍රදේශයක භූ දර්ශනය භෞතික භූ දර්ශනය හා මානුෂ භූ දර්ශනය යනුවෙන් ආකාර දෙකක් ඔස්සේ හඳුනාගත හැකි අතර මෙම භූ දර්ශන අතර සබඳතාවය මගින් ප්‍රදේශයක සමස්ථ භූ දර්ශනය නිර්මාණය වේ.




1. ශ්‍රී ලංකාවේ ජන ව්‍යාප්තිය මෙම සිතියමෙහි දැක්වේ. එම සිතියම හොඳින් නිරීක්ෂණය කර ජන සංඛ්‍යා ව්‍යාප්ති රටාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියා දක්වන්න.

2. ශ්‍රී ලංකාවේ ජන සංයුතිය දැක්විය හැකි ප්‍රධාන ආකාර මොනවාද?

3. ජනාවාසයක ඇතුලත් අංග මොනවාද?

4. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ජනාවාස වර්ග මොනවාද?

5. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශ්‍රී ලංකාව තුළ ගෙන තිබෙන ක්‍රියාමාර්ග හතරක් ලියා දක්වන්න.

6. පහත දැක්වෙන සිතියම ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




I. A,B හා C අක්ෂර වලින් දැක්වෙන නිදහස් වෙළඳ කලාප තුන නම් කරන්න.

II. D අක්ෂරයෙන් දැක්වෙන නාගරික ජනාවාසය කුමක්ද ?

III. E හා F අක්ෂර වලින් දැක්වෙන ජල විදුලි බලය නිෂ්පාදනයට දායක වන ගංගා දෙක නම් කරන්න.

IV. G අක්ෂරයෙන් දැක්වෙන අඩුම ජන සංඛ්‍යාවක් ජීවත්වන දිස්ත්‍රික්කය කුමක්ද?

*සැකසුම - ඉසුරු බණ්ඩාර, නිවිතිගල අධ්‍යාපන කලාපය, දොළොස්වලකන්ද විද්‍යාලය*